# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## දෙවන ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපෑල : info@nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**කතෝලික ධර්මය**

**දෙවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය - 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවි වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :**

**උපදේශකත්වය :** ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා
ජාතික අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු එම්. ග්‍රෙගරි ලක්ෂ්මන් ප්‍රනාන්දු පියතුමා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කතෝලික ධර්මය) අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු එස්. ඒ. ඒ. ප්‍රනාන්දු පියතුමා, සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
අධ්‍යක්ෂ වැ.බ. (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

**අනුමතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය :** සකුන්තලා රණසිංහ මිය,
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය -**

ගරු එස්. ඒ. ඒ. ප්‍රනාන්දු පියතුමා
සහකාර කථිකාචාර්ය, ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**බාහිර සම්පත් දායකත්වය -**

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා

ජාතික අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු රංජි පවුලදොරෙයි දේවගැතිතුමිය, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු මේරි ප්‍රියදර්ශනී පැව්දි සොයුරිය, ගුරු සේවය, සිරි කුරුස විද්‍යාලය, ගම්පහ

පී. ඩී. පිලීෂියා අයිරීන් මිය, ගුරු උපදේශිකා, කැලණිය අධ්‍යාපන කලාපය

කේ. ඩී. පී. කරුණානායක මිය, ගුරු සේවය, සිරි කුරුස විද්‍යාලය, ගම්පහ

**භාෂා සංස්කරණය :** ශ්‍රීනාත් ගනේවත්ත මයා (භාෂා සංස්කාරක)

**පරිගණක පිටු සැකසීම :** බී. ඒ. එන්. බටවල මිය

**විවිධ සහාය :** ඩබ්ලිව්. එච්. ටී. සිල්වා මයා

එස්. පී. ඒ. සරත් කුමාර මයා

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැප වීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
**අධ්‍යක්ෂ,**
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම






# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| විෂයය | | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය 21.15 |

# කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙන් දැක්වෙන ජාතික අරමුණු මෙම ශ්‍රේණියේ විෂය නිර්දේශ සැකසීම සඳහා පාදක කොට ගෙන ඇත. ජාතික පොදු අරමුණු කරා එළැඹීම පිණිස මූලික වන පොදු නිපුණතා ද එම වාර්තාවේ යෝජනා කර තිබේ.

මෙම නිපුණතා අතර ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා දරුවන් තුළ ඇති කරන ප්‍රධාන විෂයය කතෝලික ධර්මය යි. අනෙක් නිපුණතා ද දරුවන් තුළ ඇති කිරීමට කතෝලික ධර්මය විෂයයට උසස් මෙහෙයක් කළ හැකි ය. මේ අනුව අනාගත සංවර්ධනය නමැති ව්‍යුහය ගොඩ නැගීම සඳහා කතෝලික ධර්මයට ලබා දිය හැකි දායකත්වය අතිවිශාල ය.

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය විෂය නිර්දේශ සැකසීමේ දී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. ඒ අනුව එම දරුවන්ට ළඟා විය හැකි නිපුණතා හා ඒ සම්බන්ධ විෂය කරුණුවලට පමණක් සීමා වී මෙම විෂය නිර්දේශ පිළියෙළ කිරීමට උත්සාහ ගෙන ඇත. එ සේ ම උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී අත්දකින්නට ද, ක්‍රියාකාරකම් මඟින් ඉඩ සලසා ඇත.

විෂය කරුණු ඉගෙන ගැනීම පමණක් නොව දේව අභිමතයට අවනත වෙමින්, දෙවි පියාණන්, ශුද්ධ බයිබලය, සාන්තුවරයන්ගේ චරිත, අවට සිටින අය, අවට පරිසරය සහ තමා අතර අන්තර් සබඳතා ගොඩනගා ගැනීම සඳහා කතෝලික බැතිමතකු තුළ තිබිය යුතු නිපුණතා ස්ථිර සාර ලෙස ඇති කිරීම ද මෙම විෂයයේ ප්‍රමුඛ අරමුණකි.

කුඩා ශිෂ්‍යයකුට කතෝලික ධර්මය ඉගැන්වීම දැඩි වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවදියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරදි වැටැහීමක් ඇති වුව හොත් එය එම ශිෂ්‍යයාගේ මෙ ලොව ජීවිතයට පමණක් නො ව සදාතන ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එ බැවින් නො දන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් නිහතමානී විය යුතුවාක් මෙන් ම අවංක ද විය යුතු ය.

ශිෂ්‍යයන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද යහපත් ජීවන පැවැත්මෙන් යුතු වෙමින් මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් ගේ වගකීම යි.

එක ම ගුරුවරයකු විසින් නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීමෙන් දරුවන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

**ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා**

1. දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි, තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.
2. දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.
3. දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.
4. ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.
5. සාන්තුවරයන්ගේ චරිත හා ශුද්ධ බයිබලය හඳුනා ගනියි.

1 - 5 ශ්‍රේණි තෙක් ප්‍රාථමික අවධියේ කතෝලික ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

**ඉගැන්වීමේ ක්‍රමෝපාය**

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය ඉගැන්වීමේ දී ශිෂ්‍යයන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනාව, ආගමික චාරිකා, දේව මන්දිර නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද බයිබල් කතා, සාන්තුවර චරිත කතා, සභා ඉතිහාසය හා සම්බන්ධ කතා දෘශ්‍යාධාර සමඟ රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතා ම සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ලෙන් කතෝලික ධර්මය ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම ශිෂ්‍යයා ක්‍රමයෙන් ජේසුස් වහන්සේ වෙතට සමීප කිරීමක් ද සිදු වේ.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්**

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් කතෝලික ධර්මය විෂය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතියෙහි දී මෙම නිපුණතා ගොඩනැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයිති මීසම භාර පියතුමා හෝ ළඟ ම පිහිටි දෙව් මැඳුරක නැතහොත් ආයතනයක පියතුමා හෝ හමුවීමට සිසුන්ට අවස්ථාව සලසා දීම සුදුසු ය. එ සේ ම වාරයකට අවම වශයෙන් දෙ වතාවක් වත් දෙව් මැඳුරට ළමයින් රැගෙන යාමෙන් දෙවි පියාණන් වහන්සේ ගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශීර්වාද ඇසුරෙන් ගොඩ නැඟෙන සමානාත්මතාව, සුහදතාවය, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතියෙහි දී කතෝලික ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂයයේ ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

## විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන සැදැහැවත් කිතුනු දරුවකු බිහි කිරීම

2. කිතුනු ප්‍රතිපත්ති අනුගමනය කරන ජීවන දර්ශනයක් ගොඩනංවා දීම

3. ශුද්ධ බයිබලය යනු දේව වචනය බවට දැනුම්වත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම

4. දෙවි පියාණන් වහන්සේ සමඟ ආත්මීය සබඳතා ගොඩනගා ගැනීමට පුරුදු පුහුණු කිරීම

5. මරියතුමිය ගේ සහ සාන්තුවරයන්ගේ චරිතවලින් ආදර්ශ ලබා දීම

6. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම

7. ස්වභාව ධර්මයෙන් හා තමා අවට ජීවත් වන අය මඟින් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම

8. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමගියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම

9. අන්‍යාගම්වලට ද ගරු කරමින් සහයෝගිතාවෙන් යුතු ව ජීවත් වීමේ මැදහත් ගුණාංග වර්ධනය කිරීම

10. ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ වගකීම් සහ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1. මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම | 1. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි. | 1.1 නව වසරට තුති පිදීම |
| | | 1.2 දේව ආදරයේ සලකුණු වන සොබා දහමේ සම්පත්<br>* පොළොව<br>* අහස<br>* දිය දහර |
| | | 1.3 තමාට ආදරය කරන අය<br>* ගුරුවරු<br>* යහළුවෝ<br>* අසල්වැසියෝ |
| | | 1.4 පෞද්ගලික පවිත්‍රතාව මඟින් මහෝත්තම දෙවිඳුන් දුන් සිරුරට ගරු කිරීම<br>• දෛනික සෞඛ්‍ය යහපුරුදු |
| | | 1.5 දෙමාපියන් ගේ සහ ගුරු මාපියන් ගේ යහපත් ඔවදන්වලට කීකරු වීම |
| | | 1.6 අපේ උදවු අවශ්‍ය අයට පිහිට වීම |
| | | 1.7 යහපත් කිතුනු දරුවකු වීම |
| 2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම | 2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි. | 2.1 නැමැදීමේ ඉරියවු<br>• දණ නමස්කාර කිරීම<br>• දෑත් එක් කොට වැඳීම<br>• දොහොත් මුදුන් දී වැඳීම |
| | | 2.2 පොදු යැදුම්<br>• නමෝ මරිය යාච්ඤාව |
| | | 2.3 සාමූහික දේව පවුලක් ලෙස මහෝත්තම දෙවි පියාණන් නැමැදීම<br>• නිවසේ දී<br>• පාසලේ දී<br>• දේවස්ථානයේ දී |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **3. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම** | 3. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි. | 3.1 එදිනෙදා ජීවිතයේ දී අපට සහාය වන්නෝ<br>• ආහාර පාන සැපැයීම<br>*නිද* : ගොවියෝ, ධීවරයෝ<br>• යහමඟ පෙන්වීමට සහ ඉගැන්වීමට<br>*නිද* : පියතුමාලා, පැවිදි සහෝදර-සහෝදරියෝ, ගුරුවරු<br>• රෝගාතුර වූ විට<br>*නිද* : වෛද්‍යවරු, සාත්තු සේවක සේවිකාවෝ<br>• ගමන් බිමන් යාමට<br>*නිද* : රියදුරෝ, ආරක්ෂක නිලධාරිහු |
| **4. උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග** | 4. උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි. | 4.1 සරල දිවි පැවැත්ම<br>• බෙත්ලෙහෙම් නුවර දී<br>• නාසරෙත්හි දී |
| | | 4.2 අවනත භාවය<br>• මහෝත්තම දෙවි පියාණන් වහන්සේට අවනත වීම (පාස්කු සිද්ධිය) |
| **5. ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත** | 5. ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි. | 5.1 ශුද්ධ බයිබලයේ චරිත<br>• ආදම් සහ ඒව<br>• කායින් සහ ආබෙල්<br>• නෝවා සහ ජලගැල්ම |
| | | 5.2 සාන්තුවරයන්ගේ චරිත<br>• සාන්ත දොමිනික් සාවියෝතුමා<br>• සාන්ත නිකුලස් මුනිතුමා |

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### දෙවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info@nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.1

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ලබා දී ඇති නව වසර පිළිබඳ සතුට දනවන ගීතයක් ගායනා කරමින් තුති පුදයි.
- නව වසරේ මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ලබා දී ඇති අලුත් දේ නම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ගීතිකාව අඩංගු පෝස්ටරයක්
- කැසට් පටිය (කිතුනු ළමා ගී - 2, කිතුනු ගී 27)
- අලුත් පොත්, බුලත්
- ආදේශ සංගීත භාණ්ඩ

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පන්තියේ සියලු සිසුන්ට ගීතය අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය වන ලෙසින් අඩ කවයකට සිටුවන්න.
- පහත සඳහන් ගීතය ගායනා කරමින් මහෝත්තම දෙවිපියාණන්ට තුති පුදන්න.

දෙවි පියාට ප්‍රශංසා වේ වා
ප්‍රශංසා වේ වා //
දෙවි පුතාට ප්‍රශංසා වේ වා
ප්‍රශංසා වේ වා //
ශුද්ධාත්මයාණන්ට ප්‍රශංසා වේ වා
ප්‍රශංසා වේ වා //
මේ නව වසරේ දෙවි සමිඳුන් හට
ප්‍රශංසා වේ වා //
ඔබගෙන් මා ලද සියලුම දේ හට
ප්‍රශංසා වේ වා //
ඔබගෙන් මා ලද නව ජීවිතයට
ප්‍රශංසා වේ වා //

පියවර 2 :

- නව වසරේ සිසුන් ලද සියලු ම දේ පිළිබඳ ව කතාබහක යෙදෙන්න.
- නව වසර තුළ සියලු ම සිසුන්ට ලැබී ඇති පොදු දේ ගොනු කරන්න.
- ඒ සියලු ම දේ සඳහා දෙවි පියාණන්ට තුති පිදීමට සිසුන් යොමු කරන්න.

පියවර 3 :

- බුලත් හුරුල්ලක් ළමයින්ට ලබා දී ගුරුතුමියට වැඳ ආචාර කරවන්න.

පියවර 4 :

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය දක්වමින් ප්‍රතිප්‍රේමය දැක්වීම සඳහා පහත සඳහන් යාච්ඤාව ළමයින් සමඟ උච්චාරණය කරන්න.

'ආදර දෙවි පියාණනි, මේ නව වසරේ
පුංචි අපහට ලබා දුන් සියලු ම දේ හට
ස්තුති ප්‍රශංසා කරමු.'

**තක්සේරුව :**

- මේ නව වසර සඳහා සිසුන් ලද සියලු ම දේ චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තමන් හට ලැබෙන සියලු ම දේ ආදරයෙන් රැක ගනිමින් දෙවි පියාට තුති පිදීම.

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මගින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.2

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ලබා දුන් සොබා සම්පත් ආරක්ෂා කළ යුතු බව ප්‍රකාශ කරයි.
- සාමූහික දායකත්වයෙන් යුතු ව මැටි ගෙනැවිත් පාසල් භූමියේ ආකෘතියක් තනා අප වෙනුවෙන් පොළොව මැවූ මහෝත්තම දෙවිඳුන්ට ප්‍රශංසා කරයි.
- ජලය පානය කිරීමෙන් පිපාසය නිවා ගැනීමට දිය දහර මැවූ මහෝත්තම දෙවිඳුන්ට ප්‍රශංසා කරයි.
- 'මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ස්තුති වේ වා!' යනුවෙන් ලියන ලද කඩදාසි තීරුවක් එල්ලා වායු පිරවූ බැලූනයක් අහසට යවමින් අප වෙනුවෙන් අහස මැවූ දෙවිඳුන්ට ප්‍රශංසා කරයි.
- දෙවි පියාණන් මැවූ දේවල් නිවැරදි ව යා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- මැටි, ජලය අඩංගු භාජනයක්
- බැලූනයක්
- සතුන් ජලය පානය කරන පින්තූර
- පෙළ පොතේ අඩංගු ගීතිකාව (සිඟිතිකා ගී තැටිය) - (ධර්මදූත)

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සියලු ම සිසුන් පාසල් වත්තට රැගෙන ගොස් එහි ඇති අලංකාරය නැරඹීමට සලස්වන්න.
- පාසල් භූමියේ ඇති ස්වාභාවික සම්පත් ආරක්ෂා කරන්නේ කෙසේදැයි විමසන්න.
- සොබා දහම දෙවිඳුන්ගෙන් ලත් මහඟු දායාදයක් බව පවසන්න.

පියවර 2 :
- සිසුන් රැගෙන එන ලද මැටිවලින් පාසල් භූමියේ ඇති දේ නිර්මාණය කිරීමට සලස්වන්න.
- පාසල් ආකෘතිය අඩංගු රඳවනය තුළ සිසුන්ගේ සියලු ම නිර්මාණ විචිත්‍ර අයුරින් සකස් කරන්න.
- පොළොවෙන් ලබාගත් මැටි ඇසුරින් නිර්මිත දේ පෙන්වා දෙමින් දෙවි මහෝත්තමයාණන් වහන්සේට තුති පුදන්න.

පියවර 3 :
- සිසුන් රැගෙන ආ ජලයෙන් දෑත් පිරිසිදු කර අනතුරු ව ජලය පානය කිරීමටත් අවස්ථාව සලසන්න.
- එම ක්‍රියාවලිය මඟින් පිපාසය නිවාගත් ආකාරයත්, පිරිසිදු වූ ආකාරයත් සාකච්ඡා කරන්න.
- දිය දහර මවා වදාළ දෙවි මහෝත්තමයන්ට ප්‍රශංසා කරන්න.

පියවර 4 :
- සිසුන් රැගෙන ආ බැලූනය තුළ 'දෙවි මහෝත්තමයාණන්ට ස්තුති වේ වා' යන ශීර්ෂ පාඨය ලියා එය බැලූනයේ රඳවා බැලූනය අහසට යවන්න.

පියවර 5 :
- 'එන්න යන්න ජේසු වෙතට යාළුවේ' යන ගීතය ගායනා කරන්න.

**තක්සේරුව :**

- දෙවි පියා මැවූ දේවල් නිවැරදි ව යා කරයි.
- සතුන් ජලය පානය කරන චිත්‍ර ඇසුරින් සිසු අදහස් සරල වැකියකින් ලියා දක්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තමන් හට ලැබෙන සියලු ම දේ ආදරයෙන් රැක ගනිමින් දෙවි පියාට තුති පිදීම, පැළයක් සිටුවා එයට සාත්තු කිරීම

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 1.3

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය නිසා අපට ලැබුණු ගුරුවරුන්, යහළුවන් සහ අසල්වැසියන් වෙනුවෙන් ස්තුති යාච්ඤාවක් උච්චාරණය කරයි.
- ගුරුවරුන්, යහළුවන් හා අසල්වැසියන් අපට ආදරය කරන ආකාරයත්, අප ඔවුන්ට ප්‍රතිප්‍රේමය දක්වන ආකාරයත් නාට්‍යානුසාරයෙන් රඟ දක්වයි.

**ඉගෙනුම් සම්පත්** : • කතන්දරයේ අවස්ථා කිහිපයක් දැක්වෙන පින්තූර, රංගනයට අවශ්‍ය ඇඳුම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • මෙම සිද්ධියෙන් ආරම්භ කරන්න.

''තෙරේසා ඉගෙනීමට දුර්වල යි. එ නිසා පන්තියේ ළමයින් ඇයව කොන් කරනවා. දෙව්ශිනී තෙරේසාට ආදරය කරමින් පාඩම් කිරීමට උපකාර කළා ය. එම ආදරය නිසා තෙරේසා වැඩි ලකුණු ලබා පන්තියේ දක්ෂ දරුවකු ලෙස කටයුතු කළා ය. ගුරුතුමිය තෙරේසාට තෑගි ලබා දී හොඳ ළමයා කියමින් ඇය අගය කළා ය.''

- කතන්දරය ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්න සාකච්ඡා කරන්න.
  1. තෙරේසා කොන් කළෝ කවුරු ද ?
  2. තෙරේසා කොන් වූයේ ඇයි ?
  3. ඇයගේ හොඳ ම යහළුවා වූයේ කවරෙක් ද ?
  4. ගුරුතුමිය ඇය වෙනුවෙන් කළේ කුමක් ද ?
  5. දෙව්ශිනී තෙරේසාට ආදරය කළේ ඇයි ?
- ඒ ඇසුරින් හොඳ ළමයකුගේ ගුණාංග මොනවා දැයි සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.

පියවර 2 : • පහත කවිය ගායනා කිරීමට යොමු කරන්න.

තරහ ගන්නෙ නෑ
දබර වෙන්නෙ නෑ
සුවඳ මල් වගේ
යාළුවෝ අපී

අපෙන් කාට වත්
නොවේ කිසි දොසක්
සමඟියෙන් යුතු
යාළුවෝ අපි

එක ම මවකගේ
දූ පුතුන් වගේ
ආදරෙන් පිරී
යාළුවෝ අපී

යාළුවන් ඇතොත්
හිතට නෑ දුකක්
එවැනි ගති ඇතී
යාළුවෝ අපී

පියවර 3 :
- 'හොඳ ම මිතුරා සහ ඔබේ ගුරුතුමිය' චිත්‍රයට නැඟීමට සලස්වන්න.
- හොඳ යහළුවකු සතු යහපත් ගුණාංග සොයා නම් කරවන්න.

පියවර 4 :
- 'හොඳ අසල්වැසියෝ' යන මාතෘකාවට අදාළ රංගනයක යොදවන්න.

**තක්සේරුව :**

- හොඳ ළමයකුගේ ගුණාංග ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අසල්වැසියන් උදෙසා යාච්ඤා කරයි.

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 1.4

- තම සිරුර ආදරයෙන් රැකබලා ගැනීමට කළ හැකි දෛනික සෞඛ්‍ය යහපුරුදු නම් කරයි.
- දෛනික සෞඛ්‍ය යහපුරුදු අනුගමනය කරයි.
- පිරිසිදු ව සිටීම පිළිබඳ ව කවියක් ගායනා කරයි.
- 'ඔබෙ අත දිගු කරලා' ගීතිකාව රංගනයෙන් යුතු ව ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- සෞඛ්‍ය පුරුදු දැක්වෙන පෝස්ටර
- දත් බුරුසුවක්, සබන් කැල්ලක්
- වතුර බේසමක්
- ඒප්‍රන් එකක්
- යහපුරුදු ගැන කියවෙන ගීතය ලියන ලද පෝස්ටරය/ගීතය අඩංගු කැසට් පටිය

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සියලු දරුවන් පන්තිය ඉදිරියේ ගුරුතුමිය අසලට කැඳවා ගන්න.
- යහපුරුදු දැක්වෙන පෝස්ටර දරුවන්ට පෙන්වන්න.
- පෝස්ටරවල සිසුන් දුටු දේ මොනවාදැයි විමසා සිසුන් සමඟ ඒ ගැන සාකච්ඡා කරන්න.

පියවර 2 :

- දරුවන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන් රැගෙන ආ දත් බුරුසුවෙන් නිවැරදි ව දත් මැදීමට යොමු කරන්න.
- කට හොඳින් සෝදා ගැනීමට ද සිසුන්ට උපදෙස් දෙන්න.
- අනතුරු ව අප අත් හොඳින් සෝදා පිරිසිදු කරගත යුතු අවස්ථා මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- සබන් යොදා අත් හොඳින් සෝදා පිරිසිදු කර ගැනීමට දරුවන් යොමු කරන්න.

පියවර 3 :

- පහත කවිය හෝ 'ඔබෙ අත දිගු කරලා' යන ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. රංගනයක් ඉදිරිපත් කරන්න.

දිග නියපොතු වැඩුණු
තිබෙනු හොඳ නෑ කප්පනු
දත් පෙළ කුණු බැඳුණු
පෙනෙයි කැත ලෙස හොඳින් සෝදනු

**තක්සේරුව :**

- දින පතා ම අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු කිහිපයක් ඇඳ නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෛනික යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මගින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.5 ජේසු සමිඳුන්ගේ කුඩා කල සිදුවීම් ප්‍රකාශ කරයි.

- 'අම්මට මං ආදරෙයි. ඒ වාගෙ ම කීකරුයි' (හෝ තාත්තට, ගුරුතුමියට, . . .) යනුවෙන් ලියා විචිත්‍ර ලෙස සරසන ලද කාඩ්පතක් මවට/පියාට/ගුරුතුමියට පිළිගන්වයි.
- නිවසේ දී දෙමාපියන්ට කීකරු වූ අවස්ථාවක් දෙමාපියන්ගේ අනුදැනුම ඇති ව චිත්‍රයට නගයි.

**ඉගෙනුම් සම්පත්** :

- බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලක්
- කතුර, ගම්, පාට කූරු
- විසිතුරු කොළ
- අම්මා, තාත්තා, ගුරුතුමී ගැන කියවෙන ගීතය
- ගුරුතුමිය ගැන ලියවූ කවි ලියන ලද පෝස්ටරය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- පහත ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.
- ගුරුතුමිය වරක් කී පසු දරුවන් ගීතය ගායනයට යොමු කරවන්න.

අම්මට මම ආදරෙයි ආදරෙයි ආදරෙයි

අම්මට මම ආදරේ නිසා
මම හොඳ පොඩි ළමයෙකු වෙනවා

තාත්තට මම ආදරෙයි ආදරෙයි ආදරෙයි
තාත්තට මම ආදරේ නිසා
මම කීකරු ළමයෙකු වෙනවා

ගුරුතුමියට කීකරුයි කීකරුයි කීකරුයි
ගුරුතුමියට කීකරු නිසා
මම යහපත් ළමයෙකු වෙනවා

පියවර 2 :

- අම්මා, තාත්තා අපට ආදරය කරන අයුරු දරුවන්ගෙන් විමසන්න.
- ඒ පිළිබඳ ව දරුවන් සමඟ සාකච්ඡා කරන්න.
- දෙමාපියන් දරුවන්ට ආදරය කරන අයුරු හා දරුවන් දෙමාපියන්ගෙන් ලබන ආදරය පිළිබඳ අත්දැකීම් ප්‍රකාශ කිරීමට දරුවන්ට අවස්ථාව ලබා දෙන්න.
- දරුවන් වශයෙන් නිවසේ දී දෙමාපියන්ට ආදරය දක්වන අයුරු හා කීකරු වන අයුරු සාකච්ඡා කරන්න.

පියවර 3 :

- නිවසේ දී දෙමාපියන්ට මෙන් ම පාසලේ දී ගුරුතුමියට ආදරය විය යුතු බව, කීකරු විය යුතු බව අවබෝධ කර දෙන්න.
- සිසුන් පන්ති කාමරයට රැගෙන විත් ඇති ද්‍රව්‍ය භාවිත කර අලංකාර විචිත්‍රවත් කාඩ්පතක් සෑදීමට යොමු කරවන්න.

- එහි 'අම්මාට මම ආදරෙයි.  ඒ වගේ ම කීකරුයි' (නැතහොත් තාත්තාට, ගුරුතුමියට) යන වැකිය ලියා අදාළ පුද්ගලයාට පිළිගැන්වීමට යොමු කරන්න.

පියවර 4 :
- පහත කවිය ලියන ලද පෝස්ටරය සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- එය තාලයට ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

අපේ ගුරුතුමී - අපට ආදරේ
අපිත් ඒ වගේ - ගොඩක් ආදරේ

දුටුව විට නැගී - දෑත් වැඳ අපී
අපේ ගුරුතුමී - තුටින් පිළිගමූ

දෙවි පියා අපේ - ඉගැන් වූ ලෙසේ
හොඳ ළමුන් වගේ - ගුරුතුමී වදිමි

**තක්සේරුව :**

- නිවසේ දී දෙමාපියන්ට කීකරු වූ අවස්ථාවක් චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙමාපියන්ට හා ගුරුවරුන්ට නිතර ම ආදරය දක්වීමට හා කීකරු වීමට යොමු වීම

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මගින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.6

- වැඩිහිටි නිවාසයක්, ළමා නිවාසයක් හෝ විශේෂ අවශ්‍යතාව ඇති අය හෝ වෙතට පැමිණ උදවු කරමින් ප්‍රීතිමත් අවස්ථාවක් සම්පාදනය කිරීමට දායක වෙයි.
- අපේ උදවු අවශ්‍ය අයට පිහිට වීමෙන් මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- විශේෂ අවශ්‍යතා ඇති අය සහ රෝගීන් වෙනුවෙන් යාච්ඤා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ක්‍රීඩා උපකරණ
- අසල පිහිටි වැඩිහිටි නිවාසයක්/ළමා නිවාසයක් හෝ එබඳු ස්ථානයක ක්‍රියාකාරකම් හෝ දැක්වෙන දෘශ්‍ය සංයුක්ත තැටියක්
- විශේෂ අවශ්‍යතා ඇති අය දැක්වෙන පින්තූර නැතහොත් පෝස්ටර්
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- 'දක්වත ඔබ මගේ ඉතා' ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 163)

(පුන ගැයුම) දක්වත ඔබ මගෙ ඉතා
කුඩා බෑයකුට දයා
ඒ කරන්නෙ මට තමා
ඒ කරන්නෙ මට තමා

සිටියෙමි මම හාමතේ ඔබ මා කැව්වේ
සිටියෙමි මම පිපාසේ ඔබ මා පෙව්වේ
ඇතුළු වන්නැ දූන් මගේ පියාගෙ රජයට සගේ

සිටියෙමි මම නිරුවතේ ඔබ ම පෙරෙව්වේ
සිටියෙමි මම ලෙඩ ඇඳේ මටො'බ සැලකුවේ
ඇතුළු වන්නැ දූන් මගේ පියාගෙ රජයට සගේ

සිටියෙමි මම මහලු වී ඔබ මා සැලකූ
සිටියෙමි සොවගින් තැවී ඔබ මා සැනසූ
ඇතුළු වන්නැ දූන් මගේ පියාගෙ රජයට සගේ

පියවර 2 :

- ගීතිකාවෙන් කියවෙන දේ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- යාමට පහසු ස්ථානයක වැඩිහිටි නිවාසයක් හෝ ළමා නිවාසයක් හෝ ඇත් නම් එය නැරඹීමට දරුවන් රැගෙන යන්න. එසේ නැති නම් දෘශ්‍ය සංයුක්ත තැටිය හෝ පින්තූර, පෝස්ටර් හෝ මගින් එවන් ස්ථානයක් නැරඹීමට සලස්වන්න.
- දරුවන් දුටු දේ, දරුවන්ගේ අත්දැකීම් දරුවන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 3 : • එවැනි අය ප්‍රීතිමත් කිරීමට කළ හැකි දේ දරුවන්ගෙන් විමසන්න.

• ඒ අය වෙනුවෙන් කළ හැකි උදවු ගැන සාකච්ඡා කරන්න.

• දරුවන්ට හැකි අයුරින් ඔවුන්ට උදවු කිරීමට හැකි අවස්ථාවක් සම්පාදනය කරගන්න. (අවශ්‍ය නම් දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ උදවු ලබා ගන්න.)

පියවර 4 : • පාසලේ, තම නිවෙස්වල දන්නා රෝගී අය සිටිත් නම් ඒ අය ගැන විමසා දන්වන්න.

• ඒ අය වෙනුවෙන් ඔවුන්ගේ නම් කියා සිසුන් සමඟ යාච්ඤා කරන්න.

**තක්සේරුව :**

- අසරණ අයට උදවු කළ හැකි අයුරු චිත්‍රයකට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අසරණ අයට උදවු කිරීමට යොමු වීම සහ රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මගින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.7

- ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස 'හොඳ ළමයා' දිනය ගත කළ ආකාරය වාර්තා කරයි.
- යහපත් කිතුනු ගුණාංග ඇති කර ගනිමින් ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස කටයුතු කළ ආකාරය චිත්‍රයට නඟයි.
- සමඟියෙන් යුතු ව ක්‍රීඩාවල නිරත වෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- ගීතය ලියන ලද පෝස්ටරය
- දින චර්යා සටහන අඩංගු පැවරුම් පත්
- කිතුනු ගී පොත
- $A_4$ කොළ, පැස්ටල්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පන්තියේ සියලු සිසුන්ට ගීතය අඩංගු පෝස්ටරය දැකිය හැකි වන ලෙසින් අඩ කවයකට සිටුවන්න.
- පහත ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.

දුවනවා - පනිනවා
නටනවා - ගයනවා
අපි අපේ පන්තියේ හොඳ ළමයි
අපි අපේ පන්තියේ හොඳ ළමයි

සල් ගහේ - මල් වගේ
ආකහේ - තරු වගේ
අපි අපේ පන්තියේ හොඳ ළමයි
අපි අපේ පන්තියේ හොඳ ළමයි

අඳිනවා - හදනවා
කියනවා - ලියනවා
අපි අපේ පන්තියේ හොඳ ළමයි
අපි අපේ පන්තියේ හොඳ ළමයි

පියවර 2 :
- ඉහත ගීතයේ සඳහන් හොඳ ළමයින් පන්තියේ දී කරන වැඩ පිළිබඳ ව කතාබහක යෙදෙන්න.
- ඒවාට අමතර ව හොඳ ළමයින් තුළ තිබිය යුතු ගුණාංග ගැන සිසුන්ගෙන් විමසන්න.
- සෑම ශිෂ්‍යයකුට ම ඉදිරියට පැමිණ තමා හොඳ ළමයකු ලෙස ජීවත් වන ආකාරය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න.

පියවර 3 :
- සිසුන් සියලු දෙනා පන්ති කාමරයෙන් එළිමහනට රැගෙන ගොස් කණ්ඩායම් කර, ජය පරාජය පිළිගනිමින් සමඟියෙන් ක්‍රීඩාවක යෙදීමට අවස්ථාව දෙන්න.

පියවර 4 :
- පහත වගුව අඩංගු පැවරුම් පත් සිසුන්ට බෙදා දෙන්න.

- තමා ගෙදර දී මෙපමණ කල් කටයුතු කළ ආකාරයට එහි තරු සලකුණු ඇලවීමට සිසුන් යොමු කරන්න. (ඉතා හොඳ යි, සාමාන්‍ය යි, අඩු යි යන ශ්‍රේණිගත කිරීම් සඳහා සුදුසු පාට 3කින් තරු යොදා ගන්න.)

**පැවරුම් පත**

| නම ........................................ | | | |
|---|---|---|---|
| මම කරන වැඩ | ✡ ඉතා හොඳ යි | ✡ සාමාන්‍ය යි | ✡ අඩු යි |
| 1. කම්මැළි නැති ව අවදි වීම. | | | |
| 2. තනි ව ම සූදානම් වී උදේ ආහාර ගැනීම | | | |
| 3. පාසල් ඒමට පෙර ජේසුස් වහන්සේ සමඟ කතා කිරීම | | | |
| 4. යහළුවන් සමඟ සමඟියෙන් සිටීම | | | |
| 5. ගුරුවරුන්ට කීකරු වීම | | | |
| 6. දුර්වල යහළුවන්ට උදවු වීම | | | |

පියවර 5 : • පහත ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 267)

දෙවිඳුන් හඳුනන්නේ
සතුටින් අපි ඉන්නේ
අප යන මඟ දන්නේ - කිසිමදා
නැත එය වරදින්නේ

මව්පියනට අවනත වන්නේ
වැරදි මඟක නැත අපි යන්නේ //
උඩඟුව දුරුකර හොඳ ගුණ ගරු කර
දින දින අපි ජීවත් වන්නේ

කිසි විට නැහැ බොරු ජය ගන්නේ
ඇත්ත කියන්නයි පෙළඹෙන්නේ //
වරද දුටුව තැන පෙන්වා දෙනු මැන
තුති දී අප එය පිළිගන්නේ

- ගීතිකාවෙන් කියවෙන දේ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**තක්සේරුව :**

- යහපත් කිතුනු දරුවකු ලෙස කටයුතු කළ අවස්ථා ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- යහපත් ගුණාංග ඇති ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස ජීවත් වීමට පෙලැඹීම.

## 2.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.1

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේට වන්දනා නමස්කාර කිරීමේ දී පිළිපැදිය යුතු ඉරියව් පෙන්නුම් කරයි.
- දේවස්ථානයට ගොස් නිවැරදි ඉරියව් යොදා ගනිමින් යාච්ඤා උච්චාරණය කරයි.
- දේවස්ථානයේ දී අල්ප ශබ්දතාවෙන් යුතු ව හැසිරෙයි.

**ඉගෙනුම් සම්පත්** :

- ''සිරස නමා'' ගීතය අඩංගු කැසට් පටිය
- නැමඳීමේ ඉරියව් දැක්වෙන පින්තූර (දොහොත් මුදුන් දී වැඳීම, දණ නමස්කාර කර වැඳීම, දෑත් එක් කර වැඳීම)
- දේවස්ථානයක පින්තූර
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පන්තියේ සියලු සිසුන්ට පහත ගීතිකාව අඩංගු කැසට් පටියට සවන්දීමට සලස්වන්න. (කිතුනු දී අංක 348)

සිරස නමා අයැද කමා ඔබ නමඳිමු ජේසු

දෙවි බව සුසිගිති පූපෙක සඟවා
ඔබ වෙත අප සැම කැඳවූ
ඒ දෙවි කුලයට ගැති අප නහවා
ඔබෙ හද තුළ අප රැඳවූ

ගෙන මනු බව කුස තුළ මරි මවගේ
ඇගෙ එක මනු දෙවි දරු වූ
දින දින රස ගැන්වෙන අප දිවි'ගේ
පව් ලොවැ ගැලවුම් කරු වූ

පියවර 2 :

- සූදානම් කරගෙන ඇති නැමඳීමේ ඉරියව් දැක්වෙන පින්තූර තුන වෙන වෙන ම සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එක් එක් පින්තූරයේ දැක්වෙන නැමඳීමේ ඉරියව් ගැන සිසුන් සමඟ කතාබහක යෙදෙන්න.

පියවර 3 :

- සිසුන් අසල ඇති දේවස්ථානයකට රැගෙන යන්න. නැතිනම් පින්තූරයක් පෙන්වන්න.
- දේවස්ථානයට ඇතුළුවීමට පෙර දණ නමස්කාර කර වැඳීමට සිසුන් යොමු කරන්න.
- දේවස්ථානය තුළ දී සන්සුන් ව සැදී පැහැදී සිටීමට ද සිසුන් යොමු කරන්න.
- දේවස්ථානය තුළ වැඩ වසන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.
- දොහොත් මුදුන් දී වඳිමින් පහත ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 319)

ජේසුනි ඔබට නමෝ
ඔබෙ පිය දෙවි තුමට නමෝ
ඔබ සමඟින් නිති කල් වැජඹෙන
සුදතුම් හට ද නමෝ

පියවර 4 :
- දෑත් එක් කර හිස නමා කුඩා යාච්ඤාවක් සිසුන් සමග උච්චාරණය කරන්න.
- යාච්ඤාව අවසන් වූ පසු දේවස්ථානයෙන් පිටවීමට පෙර නැවතත් දණ නමස්කාර කර දෙවි පියාණන් වහන්සේට සිසුන් සමග වන්දනා කරන්න.
- අනතුරු ව නිහඬ ව දේවස්ථානයෙන් පිට වී යාමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේ නමදින ආකාර චිත්‍රවලට ගැළපෙන ලෙස යා කරන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි සෑම දිනක දී ම දේවස්ථානයට ගොස් දෙවි පියාණන් වහන්සේ සමග කතා කිරීම, යාච්ඤා කිරීම.

## 2.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමග කතා කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමඟ කතා කරයි.

**ඉගෙනුම් පල** : 2.2

- නමෝ මරිය යාච්ඤාව හෙවත් දේව දූත මංගලම් කීම නිවැරදි ව හා භක්තිමත් ව උච්චාරණය කරමින් දේව මාතාවන්ගේ මැදිහත්කම ප්‍රාර්ථනා කරයි.
- නමෝ මරිය යාච්ඤාවෙහි මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ වචනය අඩංගු වන බව ප්‍රකාශ කරයි.
- පරිසරයේ ඇති ද්‍රව්‍ය යොදා ගනිමින් ජපමාලයක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ජපමාලය
- කිතුනු ගී පොත
- දේව මෑණියන්ගේ ප්‍රතිමාව නැතහොත් දේව මෑණියන්ගේ පින්තූරයක්
- නමෝ මරියනී ගීතය අඩංගු කැසට් පටිය
- ජපමාලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පරිසරයේ ඇති ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සිසුන් පන්ති කාමරය තුළ තබා ගන්න. නැතහොත් පිටතට රැගෙන යන්න.
- 'නමෝ මරියනී' ගීතය අඩංගු කැසට් පටිය දමා එයට කිහිප වරක් හොඳින් සවන් දීමට සිසුන් යොමු කරවන්න.
- ඉන් පසු කැසට් පටිය සමඟ ගීතය ගායනා කිරීමට ද සිසුන් යොමු කරන්න.
- කැමති සිසුන් කිහිප දෙනෙකුට ඉදිරිපත් වී එම ගීතයට අනුව රඟදැක්වීමට ද අවස්ථාව දෙන්න.

පියවර 2 :

- දේව මෑණියන් තුළ ඇති යහපත් ගුණාංග පිළිබඳ ව සිසුන් සමඟ කතාබහක යෙදෙන්න.

පියවර 3 :

- දේව මාතා ප්‍රතිමාව හෝ පින්තූරය හෝ ඉදිරියේ තම ජපමාලය ගෞරවාන්විත ව රැගෙන විත් සිසුන් සමඟ ජපමාලය උච්චාරණය කරන්න.
- පහත ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 396)

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ දෑතට තුරුලු වන්න
සුදු සළු කොන අල්ල ගන්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ රසබර බස් අහන්න
ඔබෙ ඔවදන් පිළිපදින්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ රැකවරණය ලබන්න
ඔබේ උදවු පතා ඉන්න
මට හරි ආසයි //

පියවර 4 : • සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. ඔවුන් රැගෙන විත් ඇති ද්‍රව්‍ය භාවිත කර ජපමාලයක් නිර්මාණය කිරීමට යොමු කර එය පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.

**තක්සේරුව :**

- දේව මෑණියන් තුළ තිබූ යහපත් ගුණාංග තමා තුළ ඇති කරගත හැකි අවස්ථා සරල ව ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නිතර ම ජපමාලය ළඟ තබා ගනිමින් අවබෝධයෙන් යුතුව නමෝ මරිය යාච්ඤාව නිවැරදි ව උච්චාරණය කිරීම.

## 2.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.3

- සමූහයක්/පිරිසක් සිටින අවස්ථාවල දී දෙවිඳුන් වැඩ සිටින දේව පවුලක් ලෙස මහෝත්තම දෙවි පියාණන් වහන්සේට සාමූහික ව යාච්ඤා කරමින් කතා කළ හැකි බව ප්‍රකාශ කරයි.
- පන්තියේ මිතුරු-මිතුරියන් එකතු වී යාච්ඤා කරමින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කථා කරයි.
- පාසලේ දී සහ දේවස්ථානයේ දී සාමූහික ව යාච්ඤාවලට සහභාගි වෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- සතුටින් එකමුතු ව සිටින පවුලක පින්තූරයක්
- සාමූහික ව දේවස්ථානයේ යාච්ඤාවක යෙදෙන පින්තූරයක්
- ගුරුවරයා විසින් සකසා ගත් නිර්මාණාත්මක යාච්ඤාව අඩංගු පෝස්ටරය
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පහත ගීතිකාව භක්තියෙන් හා අවබෝධයෙන් යුතු ව සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 162)

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත.

ක්‍රිස්තුස්තුමන්ගෙ ප්‍රේමයෙන් අපි හැම දෙන එක් වෙමු
එතුමන් තුළ ප්‍රීතියෙන් සතුටු වෙන්නෙමු
ජීවමාන දෙවිතුමනට හද බැති පෙම් දක්වමු
අවංක වූ හෘදයෙන් එකිනෙකාට ප්‍රේම කරමු

අපි කිසියම් තැනකට එක් රැස් වී සිටිමුද
එක් සිත් වී සිටිනට ප්‍රවේසම් වෙමු
සණ්ඩු දබර නඩු හබ නොව සාමයෙන් ජීවත් වෙමු
කිතු සමිඳාණන් නිතින් අප වෙතටම කැඳවා ගනිමු

- එම ගීතිකාවේ අර්ථය සිසුන් හට පැහැදිලි කරන්න.

පියවර 2 :
- සතුටින් සිටින පවුලේ පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරය පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- පවුලේ අය එකමුතු වී යාච්ඤා කිරීමෙන් සතුට හිමි වන බව පැහැදිලි කරන්න.
- පවුලේ එකමුතු යාච්ඤාව තුළ දෙවිඳුන් වැඩ සිටින බව සිසුන්ට අවබෝධ කර දෙන්න.

පියවර 3 :
- පාසල තුළ දී අප එකමුතු ව යාච්ඤා කරන අවස්ථාවක් සිසුන්ගෙන් විමසන්න.
- එම අවස්ථාවල දී යාච්ඤා කිරීමට හේතු සාධක වන කරුණු පැහැදිලි කර දෙන්න.

**පියවර 4 :**

- සාමූහික ව දේවස්ථානයේ රැස් ව සිටින පින්තූරය පෙන්වන්න.
- පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
  1. පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද ?
  2. සියලු ම දෙනා ඒ සඳහා රැස්වන්නේ කවරදා ද ?
  3. අප සියලු ම දෙනා එකට රැස්වන්නේ ඇයි ?
  4. සාමූහික යාච්ඤාව ඔස්සේ අපට හමුවන්නේ කවරෙක් ද ?

**තක්සේරුව :**

- නිර්මාණාත්මක යාච්ඤාව උච්චාරණය කර එය බලා ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පවුල, පාසල හා දේවස්ථානය තුළ සාමූහික ව යාච්ඤාවේ යෙදීම.

## 3.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම.

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.

**ඉගෙනුම් පල** : 3.1

- එදිනෙදා ජීවිතයේ දී අපට සහය වන අය හඳුන්වා දෙමින්, ඒ සඳහා නිදසුන් සපයයි.
- 'අපට සහය වන අය' යන තේමාව යටතේ අඳින ලද පින්තූර අලවමින් සාමූහික නිර්මාණයක් වූ පෝස්ටරයක් සකසයි.
- ඔවුන්ගේ සේවාවට තුති පුදමින් යාච්ඤාවක නිරත වෙයි.
- තමා ද දේව දරුවකු බව පවසමින් අනාගතයේ දී අන් අය වෙනුවෙන් එවැනි සේවාවක් කරන ආකාරය වාචික ව පන්තියට ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ගොවියා, ධීවරයා, වෛද්‍යවරයා, හෙදිය, රියදුරා, පොලිස් භටයා, පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේ, පැවිදි සොයුරිය යන චරිතවලට අදාළ ඇඳුම් පැලැඳුම්
- ඉහත සඳහන් චරිත අඩංගු පින්තූර
- අපට සහය වන අයගේ සේවාවන් දැක්වෙන පෝස්ටරයක්
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- විවිධ චරිත නිරූපණය කළ හැකි ඇඳුම් පැලැඳුම් රැගෙන පැමිණි සිසුන්ට සූදානම් වීමට අවස්ථාව ලබා දෙන්න.
- අපට සහය වන එවැනි පුද්ගලයන්ගේ චරිත රඟදැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම චරිතවල ජීවත් වෙමින් සංවාදශීලී ව ඔවුන්ගේ සේවාවන් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- ඉහත සියලු ම සේවාවල හා පුද්ගලයන්ගේ ඇති වැදගත්කම පැහැදිලි කර දෙන්න.

පියවර 2 :

- පහත ගීතිකාව රංගනයේ යෙදෙමින් සිසුන් සමඟ ගායනා කරන්න. (කිතුනු ගී අංක 226)

එන්න සමිඳුනේ එන්න සමිඳුනේ
ඇවිත් ගන්න මගේ දෑත ඔබේ සේවෙටා
ඔබේ වැඩට ඔබෙ සේවෙට යොදා ගනු මැනේ

එන්න සමිඳුනේ එන්න සමිඳුනේ
ඇවිත් ගන්න මගේ දෑස ඔබේ සේවෙටා
ඔබ දුටු දෙය පෙන්වන්නට යොදා ගනු මැනේ

එන්න සමිඳුනේ එන්න සමිඳුනේ
ඇවිත් ගන්න මගේ දෙපය ඔබේ සේවෙටා
ඔබට ඇවැසි ගමන් යන්න යොදා ගනු මැනේ

එන්න සමිඳුනේ එන්න සමිඳුනේ
ඇවිත් ගන්න මගෙ හදවත ඔබේ සේවෙටා
ඔබ පෙම් කළ හැටි කියන්න යොදා ගනු මැනේ

- අප වෙනුවෙන් විශාල සේවාවක නිරත වන ගරු පූජ්‍ය ප්‍රසාදිවරුන්, සහෝදරතුමන් හා පැවිදි සොහොයුරියන්ගේ සේවාවන් පිළිබඳ ව සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.

  *උදා :* දිව්‍ය පූජාව පවත්වන්නේ කවරෙක් ද ?

  සහෝදරතුමාගේ හා කන්‍යා සොහොයුරියගේ සේවා මොනවා ද ?

- පූජක පැවිදි සේවාවල අගය වටහා දෙමින් ගෞරව පූර්වක ව ආචාර කිරීමට යොමු කරවන්න.

**පියවර 3 :**

- අපට සහය වන අයගේ සේවාවන් දැක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- අපට සහය වන අය කවුරුදැයි සිසුන්ගෙන් විමසන්න.
- අපට සහය වන අයට ස්තුති කර කුඩා යාච්ඤාවක් සිසුන් සමඟ උච්චාරණය කරන්න.
- සිසුන් කණ්ඩායම් කර, 'අපට සහය වන අය' තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

**තක්සේරුව :**

- සිසු කණ්ඩායම් අනුව අපට සහය වන අයගේ පින්තූර අලවා පෝස්ටරයක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි සෑම අවස්ථාවක ම අන් අයට සේවාවක් කිරීමට පෙලඹෙයි.

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**නිපුණතාව** : **උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.1

- උත්තරීතර ජේසුස් වහන්සේ බෙත්ලෙහෙමේ ගවලෙනක ඉපදුණු බවත්, සරල දිවි පෙවෙතක් ගත කරමින් නාසරෙත්හි ජීවත් වූ බවත් ප්‍රකාශ කරයි.
- කිතු උපත සිහි කරමින් සාමූහික දායකත්වයෙන් යුතු ව පන්ති කාමරයේ ගවලෙනක් ගොඩ නංවයි.
- නත්තල් සැරසිලි නිර්මාණය කරයි.
- කිතු උපතේ අරුත වන 'බෙදා ගැනීම' ක්‍රියාවට නංවමින් විවිධ ආහාරපාන රැගෙන විත් සමගියෙන් බෙදාහදා ගනිමින් භුක්ති විඳියි.

**ඉගෙනුම් සම්පත්** :

- ගවලෙනක් නිර්මාණය කිරීමට අවශ්‍ය දේ
- නත්තල් සුබ පැතුම් පත් නිර්මාණය කිරීමට අවශ්‍ය දේ
- නත්තල් සැරසිලි නිර්මාණය කිරීමට අවශ්‍ය දේ
- නත්තල් ගීත අඩංගු CD තැටිය
- පැන්සලක්, පොතක්, ලේන්සුවක් වැනි සුළු තිළිණයක්
- ගුරුතුමියගේ සහ සිසුන්ගේ නම් ලියන ලද තුණ්ඩු
- බෙදාගත හැකි ආහාර පාන
- ශුද්ධ වූ පවුලේ පින්තූරයක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- 'දේව දූතයා' සහ 'කිතුනු දරුවා' ක්‍රියාකාරකම සූදානම් කිරීම
- ගුරුතුමියගේ සහ පන්තියේ සිසුන්ගේ නම් ඇතුළත් තුණ්ඩු සකස් කර භාජනයකට දමන්න.
- ඉන් එක බැගින් ලබා ගැනීමට සියලු ම සිසුන්ට අවස්ථාව දෙන්න. ගුරුතුමිය ද තුණ්ඩුවක් ගන්න.
- එය රහසේ විවෘත කර බැලීමට උපදෙස් දෙන්න. තමා ලද තුණ්ඩුවේ නම සඳහන් මිතුරාට තමා 'දේව දූතයා' වෙමින් සති 2ක් පමණ කාලයක් ඔහු/ඇය වෙනුවෙන් යාච්ඤා කිරීමට උපදෙස් දෙන්න.
- දැනුම් දෙන ලද දිනයක දී තමා දේව දූතයකු වූ ආකාරය ක්‍රියාවට නැංවීමට අවස්ථාව දෙන්න. එදිනට තමා සූදානම් කරගෙන පැමිණි කුඩා තිළිණය තම 'කිතුනු දරුවාට' දීමට යොමු කරවන්න.
- මෙදින ම ගෙන එන ලද ආහාර පාන බෙදා ගනිමින් කුඩා සාදයක් පවත්වමින් නත්තලේ අරුත ක්‍රියාවට නංවන්න.
- නත්තල් ගීත අඩංගු සංයුක්ත තැටිය දමා ගීතිකා ගායනයට යොමු කරවන්න.

පියවර 2 :

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- එක් කණ්ඩායමක් සිසුන් රැගෙන එන ලද ද්‍රව්‍ය ඇසුරෙන් ගවලෙනක් නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- අනෙක් කණ්ඩායම නත්තල් සැරසිලි සෑදීමට යොමු කරවන්න.
- තවත් කණ්ඩායමක් නත්තල් සුබ පැතුම් පත් සෑදීමට යොමු කරවන්න.

- සැදූ නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සිසුන් යොමු කරවන්න.

**පියවර 3 :** 
- ශුද්ධ වූ පවුලේ පින්තූරය පෙන්වා එයට සිසු අවධානය යොමු කරමින් පෙළපොතේ අඩංගු 'පුංචි අපේ හොඳ මිතුරා' ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.
- ගීතයේ අඩංගු නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ හිස්තැන් පුරවන්න. (ප්‍රහේලිකාව)

  1 පහළට - ජේසුස් වහන්සේගේ සුරැකි පියා

  2 පහළට - නත්තලේ අරුත

  3 හරහට - ජේසුස් වහන්සේගේ මව




**තක්සේරුව :**

- කුඩා ජේසුස් වහන්සේ තම මවුපියන්ට උදවු කළ ආකාරයට ඔබ නිවසේ දී ක්‍රියා කරන අයුරු ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි සැම අවස්ථාවක දී ම නැති බැරි අසරණ අය සමඟ බෙදා ගැනීමට පෙලඹීම.

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**නිපුණතාව** : **උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.2

- උත්තරීතර ජේසුස් වහන්සේ දුක් විඳීම, මරණය සහ උත්ථානය මගින් අපට ආදරය දැක්වූ බව සංවේදී ව ප්‍රකාශ කරමින් චතාරික ගීතිකා ගායනයක නිරත වෙයි.
- පාස්කු අභිරහසේ නියම අරුත පහදා ගනිමින් පාද නමස්කාරයට සහභාගි වෙයි.
- චතාරික සමය තුළ තමාට කළ හැකි මර්දන ක්‍රියා හා යහපත් ක්‍රියා යෝජනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කුරුසයක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය
- පැස්ටල්/පාට පැන්සල්
- චතාරික ගීතිකා අඩංගු සංයුක්ත තැටිය
- පාද නමස්කාරයේ ස්ථාන අඩංගු පින්තූර
- 'කුරුසේ නැඟ අත් විහිදා' ගීතිකාව ලියන ලද පෝස්ටරය
- පාට කළ හැකි පහන් 10ක පින්තූර ඇතුළත් $A_4$ කඩදාසි
- කිතුනු ගී පොත
- ගීතිකාවට ගැළපෙන පින්තූර

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සිසුන් රැගෙන විත් ඇති ද්‍රව්‍ය භාවිතයෙන් කුරුස නිර්මාණය කරවන්න.
- එම කුරුස රැගෙන චතාරික ගීතිකා අවබෝධයෙන් හා ගෞරවයෙන් යුක්ත ව ගායනා කරවන්න. (කිතුනු ගී අංක 360, 361, 365)

*උදා* : 1. කුරුසේ නැඟ අත් විහිදා
මුළු ලෝ තුරුලට බදලා
සිටිනා දෙව් පුත් රදුනේ
ඔබෙ පා සිඹිමින් වඳිමු . . .

2. මා ජේසු මම කළ පවුවලට
ළතවෙමි යදිමි කමා
පවු මඟ හැරලා යහ මඟ යන්නට . . .

3. බලවූ බලවූ කුරුසේ - එල්ලෙන ජේසු අනේ
තුවාල මුළු සිරුරේ - උල්පත් සැනසීමේ
කුරුසේ ගැලවීමේ - කුරුසේ ජීවිතයේ
කුරුසේ උත්ථානේ - වැලැඳ ගනිමු කුරුසේ . . .

පියවර 2 :

- පාද නමස්කාරයේ පින්තූර පෙන්වන්න.
- ඒ ඒ ස්ථානවලට විශේෂිත සිදුවීම් පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරවන්න.
- අපේ පව් නිසා උත්තරීතර ජේසුස් වහන්සේ දුක් විඳි බව හැඟීම්බර ව ප්‍රකාශ කරන්න.
- තමන් කළ පව් සිහි කරවා ඒවා නැවත නොකිරීමට අධිෂ්ඨාන කරවන්න.

**පියවර 3 :**
- 'කුරුසේ නැග අත් විහිදා' ගීතිකාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරවන්න.
- එම ගීතිකාව පිටපත් කිරීමට අවස්ථාව ලබා දී ගැළපෙන පින්තූර කිහිපයක් අලවන්නට සිසුන් යොමු කරන්න.

**පියවර 4 :**
- පහන් 10ක් අඩංගු A4 කඩදාසි සිසුන් හට ලබා දෙන්න. (පිටුව 27 අඩංගු පරිදි පහන් 20ක් අඩංගු චිත්‍රය)
- සිසුන් විසින් කරන ලද මර්දන ක්‍රියා සඳහා දම් පාට යොදා පහන් වැටි 5ක් පාට කරවන්න. සිසුන් විසින් කරන ලද යහපත් ක්‍රියා සඳහා කොළ පාට යොදා පහන් වැටි 5ක් පාට කරවන්න.

**තක්සේරුව :**

- මරණය ජය ගත් උත්තරීතර ජේසුස් වහන්සේව චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පාපයෙන් වැළකීමට නිතර යාච්ඤා කිරීමට පෙලඹෙයි.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනාගනියි.

**ඉගෙනුම් පල** : 5.1 (අ)

- 'ශුද්ධ බයිබලය යනු දේව වචනය යි.' යන වාක්‍යය කඩදාසි තීරුවක තනි ව ම ලියා අලංකාර ලෙස සකස් කරමින් පොදු පුවරුවක අලවා ප්‍රදර්ශනය කරයි.
- ආදම් සහ ඒව, කායින් සහ ආබෙල්, නෝවා සහ ජල ගැල්ම යන සංසිද්ධි ප්‍රකාශ කරයි.
- ආදම් සහ ඒව, කායින් සහ ආබෙල්, නෝවා සහ ජල ගැල්ම යන සංසිද්ධිවල සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය
- පහන් ඇතුළු ව අවශ්‍ය උපකරණ
- පහත සඳහන් චරිත නිරූපණයට අවශ්‍ය ද්‍රව්‍ය
  - i. ආදම් සහ ඒව, කායින් සහ ආබෙල්
  - ii. කායින්ගේ සහ ආබෙල්ගේ පඬුරු
  - iii. ඒදන් උයන - සිවුපාවෝ, පක්ෂීහු, . . .

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පන්තිය ඉදිරියේ සූදානම් කර ගත් ස්ථානයක ශුද්ධ බයිබලය ගෞරවයෙන් තබන්න.
- පහන් පත්තු කරන්න.
- සියලු සිසුන් නැඟිටුවා ශුද්ධ බයිබලයේ උත්පත්ති 2 : 8 - 9 සිසුන් ඉදිරියේ ගෞරවාන්විත ව කියවන්න.

පියවර 2 :
- පාඨය පිළිබඳ ව සිසුන් ඉදිරියේ කුඩා මෙනෙහි කිරීමක් කර, ඒ මඟින් අපට දෙවිපියාණන් කථා කරන බව අවබෝධ කර දෙන්න.
- සිසුන් සමඟ කරන සාකච්ඡාව මඟින් ශුද්ධ බයිබලය යනු දේව වචනය බව සිසුන්ට වඩාත් තහවුරු කරන්න.
- අනතුරුව 'ශුද්ධ බයිබලය යනු දේව වචනය යි' යන වාක්‍යය තනි ව ම ලියා අලංකාර ලෙස සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කිරීමට යොමු කරන්න.

පියවර 3 :
- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- මැවීමේ කතාන්දරය සිසුන්ට පවසන්න.
- සූදානම් කරගත් චරිත ඇසුරින් ආදම්, ඒවගේ සිද්ධිය සිසුන් ඉදිරියේ රඟ දැක්වීමට සලස්වන්න.
- රඟ දැක්වූ කොටස පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 4 :
- ආදි මවුපියන්ගේ දරුවන් වන කායින්ගේ සහ ආබෙල්ගේ කතා පුවත සිසුන් හට පවසන්න.
- කායින් සහ ආබෙල් පඬුරු පුද කළ ආකාරය රඟ දැක්වීමට සලස්වන්න.
- ආබෙල්ගේ යහපත් ගුණාංග සිසුන්ගෙන් විමසන්න.

**තක්සේරුව :**
- ආදම් සහ ඒව, කායින් සහ ආබෙල් කතාවලින් සිත් ගත් අවස්ථාවක් බැගින් චිත්‍රයට නගයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**
- දින පතා ශුද්ධ බයිබලයේ පාඨයක් කීමට හෝ පාඨයකට සවන් දීමට හෝ යොමු වීම.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.1 (ආ)

- විවිධ අමුද්‍රව්‍ය යොදා ගනිමින් නෝවාගේ නැවේ ආකෘතියක් ගොඩ නංවයි.
- ශුද්ධ බයිබලයේ එන ඉහත චරිත ඇසුරෙන් ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- නැවක ආකෘතියක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- කුඩා කතෝලික කොඩියක්
- සතුන් කිහිප දෙනෙකුගේ පින්තූර
- පාට $A_4$ කොළ
- කතුරු, ගම් බෝතල්, රඳවනයක්
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සෑම සිසුවකුට ම $A_4$ කොළය බැගින් බෙදා දී ඔරුවක් නිර්මාණය කරවන්න.
- එම සාදන ලද ඔරුව තුළ තමාගේ නම ලිවීමට යොමු කරවන්න.
- ඉන් පසු සියලු ම ඔරු නියමිත පේළිවල අලවා විශාල නැවක් සාදන්න.
- සිසුන් රැගෙන ආ සතුන්ගේ රූප එම නැව තුළ ඇලවීමට යොමු කරන්න.
- අවසානයේ නිර්මාණය කරන ලද නැව ඉහළින් කතෝලික ධජය රඳවන්න.

පියවර 2 :

- නෝවා සහ ජල ගැල්ම පිළිබඳ කතා පුවත සිසුන්ට පවසන්න.
- දෙවි පියාණන්ගේ අනුකම්පාව නෝවා හට ලැබුණු ආකාරයත්, නෝවා දෙවි පියාණන්ගේ හඬට කීකරු වූ බවත් සිසුන් හට අවබෝධ කර දෙන්න.

පියවර 3 :

- නෝවා දෙවි පියාණන්ට තුති පිදූ ආකාරයට සිසුන්ට පහත සඳහන් ගීතිකාව ගායනයට අවස්ථාව සලසන්න. (කිතුනු ගී 252)

සමිඳුන් හට තුති ගී පූජා
කරව්ව එතුමන් ගුණේ නිසා
සදහට සමිඳුන්ගේ
දයාව පවතින්නේ

මගේ කොතෙකුත් කරදර විපතේ
සමිඳුන් හට මා අඬගැසුවේ
සමිඳෙ මට කන් දී සිටියෝ
එතුමෝ මා ගලවා ගත්තෝ

සොම්නස් රැව් දොරැ දොරැ පැතිරේ
ජය උළෙලින් මුළු රට ඇලැලේ
හා ! සමිදරුවන් තෙද'ත බලේ
දැහැමි දනා මැයි ජය ගත්තේ

**තක්සේරුව :**

- නෝවාගේ කතාවෙන් ගත හැකි ආදර්ශයක් ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙවි පියාණන්ට කීකරු වීමට හා තුති පිදීමට පෙලඹීමරැ

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනාගනියි.

**ඉගෙනුම් පල** : 5.2 (අ)

- සාන්තුවරයන් යනු ජේසුස් වහන්සේට විශේෂ ආදරයක් දැක්වූ අය ලෙස නම් කරයි.
- සාන්ත දොමිනික් සාවියෝතුමා පිළිබඳ වැකියක් ලියයි.

**ඉගෙනුම් සම්පත්** :

- සාන්ත දොමිනික් සාවියෝතුමාගේ පින්තූරයක්
- බැබළෙන තරු පොත
- කුඩා දේවස්ථාන රූප 20ක් අඩංගු කාඩ්පත්
- පාට පැන්සල්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සාන්ත දොමිනික් සාවියෝතුමාගේ පින්තූරය පෙන්වන්න.
- පහත සඳහන් දොමිනික් සාවියෝතුමාගේ ජීවිත කතාවේ අවස්ථා සිසුන්ට පවසන්න. (බැබළෙන තරු 13 පිටුව)

'දොමිනික් සාවියෝ තුමාගේ ගෙදර සාමකාමී වාතාවරණයක් තිබිණි. දොමිනික් තුමාට තම දෙමවුපියන්ගෙන් ඉතා භක්තිමත් ලෙස ආත්මීක පෝෂණය ලැබුණි. දොමිනික් සාවියෝ තුමා දෙවියන් වහන්සේ කෙරෙහි මහත් ප්‍රේමයෙන් ද, දෙව්මව් කෙරෙහි ගැඹුරු භක්තියෙන් ද සිටියේ ය.

කුඩා කල සිට පාන්දර පහට දේවස්ථානයට ගොස් දිව්‍ය පූජාවට උදවු කිරීම එතුමාගේ හොඳ පුරුද්දක් විය. ඉන්පසු සෑහෙන වේලාවක් ගැඹුරු යාච්ඤාවේ යෙදුණේය. කොතරම් බාධක පැමිණියත් සැමදාම දේවස්ථානයේ කටයුතුවලට උදව් විය.

අවුරුදු 07 දී ම ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට නිතර නිතර පියතුමාගෙන් ඉල්ලා සිටියේ ය. ඔහුගේ භක්තියත්, ආශාවත් දුටු පියතුමා පාස්කුවට තෑග්ගක් ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මගින් ජේසුස් වහන්සේ ලබා දුන්නේ ය. ඉන්පසු මෙතුමා මහත් භක්තියෙන් සැමදාම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්තේ ය.

පසුව දොමිනික්තුමා ජෝන් බොස්කෝ ආයතනයට ඇතුල් වී දෙවියන් වහන්සේට සේවය කළේය. මෙතුමා ශුද්ධ වූ ජෝන් බොස්කෝතුමාගේ ප්‍රථම ශිෂ්‍යයන්ගෙන් කෙනෙකි. ජෝන් බොස්කෝ ආයතනයේ සිටි ළමුන්ට සැබෑ ක්‍රිස්තියානි ජීවිතයක් ගත කිරීමට තම වචනයෙන් හා ක්‍රියාවෙන් ඔහු ආදර්ශවත් විය.'

පියවර 2 :

- කථාව ඇසුරු කර ගනිමින් පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න කිහිපයක් අසන්න.
  1. දොමිනික් සාවියෝතුමා ළඟ තිබූ හොඳ පුරුදු 2ක් කියන්න.
  2. පාන්දරින් අවදි වන දොමිනික් සාවියෝතුමා කළේ කුමක් ද ?
  3. දොමිනික් සාවියෝතුමා විශේෂයෙන් ගැඹුරු භක්තියක් දැක්වූයේ කාට ද ?

iv. ජෝන් බොස්කෝ ආයතනයේ සිටි ළමයින්ට එතුමා ආදර්ශයක් වූයේ කෙසේ ද ?

**පියවර 3 :** • සිසුන්ට හැකි හැම විට ම දිව්‍ය පූජාවට යාමට උපදෙස් දෙන්න.

• පහත සඳහන් ආකාරයේ රූප පත්‍රිකාවක් සකස් කර ගන්න.

*උදා :*



• දිව්‍ය පූජාවට සහභාගි වූ හැම අවස්ථාවක ම එම දේවස්ථානයක් පාට කිරීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**

• සාන්ත දොමිනික් සාවියෝතුමා ගැන සරල වැකියක් ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• දින පතා උදේ අවදි වූ විට කුඩා යාච්ඤාවක් කීමට පෙළඹීම.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනාගනියි.

**ඉගෙනුම් පල** : 5.2 (ආ)

- සාන්ත නිකුලස් මුනිතුමා ජේසුස් වහන්සේට කළ සේවාවන් නම් කරයි.
- කුඩා සාන්තුවරයකු සේ ජේසුස් වහන්සේ වෙනුවෙන් කළ හැකි සේවාවන් ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- නත්තල් සීයාගේ ඇඳුම් කට්ටලයක්
- සූදානම් කරගත් තෑගි පාර්සල්
- සාන්ත නිකුලස් මුනිතුමාගේ පින්තූරයක්
- සාන්ත නිකුලස් මුනිතුමාගේ චරිත කථාව අඩංගු පෝස්ටරයක්
- 'පුළුන් වගේ සුදු රැවුළ දිග යි' ගීය අඩංගු සංයුක්ත තැටිය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- 'පුළුන් වගේ . . . ' ගීය විකාශය කරන්න.
- නත්තල් සීයා ලෙස ඇඳගත් දරුවා ලවා ගීතයට අනුව රඟදක්වන්න. (මෙය කිසි සේත් විකට චරිතයක් ලෙසින් නොව ගෞරවාන්විත ව රඟ දැක්වීමට ද වග බලා ගත යුතු ය.)

පියවර 2 :
- සාන්ත නිකුලස් මුනිතුමාගේ පින්තූරය පෙන්වා 'නත්තල් සීයා' යනු සාන්ත නිකුලස් මුනිතුමා බව අවබෝධ කරන්න.
- සාන්ත නිකුලස් මුනිතුමාගේ චරිතය අඩංගු පහත පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- එය කණ්ඩායම් ලෙස ශබ්ද නඟා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**සාන්ත නිකුලස් මුනිතුමා**

* කුඩා දරුවන්ගේ අරක්ගත් මුනිවරයාට ය.
* මෙතුමා 'නත්තල් සීයා' නමින් හැඳින්වෙයි.
* නත්තල් සීයා යනු විශේෂයෙන් ළමයින් සඳහා තෑගි බෝග ගෙන එන සාන්තුවරයා යි.
* දිළිඳු වූවන්ට, අසරණ වූවන්ට රහසිගත ව උදවු කිරීම මෙතුමා තුළ තිබූ උතුම් විශේෂ ගුණාංගයකි.

පියවර 3 :
- සිසුන් විසින් ගෙන එන ලද තෑගි පාර්සල් දුප්පතුන් අතරේ බෙදා දෙන්න.
- පහත සඳහන් ශීර්ෂ යටතේ ඔබට වඩාත් පහසු ක්‍රමය තෝරාගෙන ක්‍රියාත්මක කරවන්න.

<u>ශීර්ෂ</u>

1 දේවස්ථානයේ - පළමු සිකුරාදා දිව්‍ය පූජාවේ දී රැගෙන ආ තෑගි පඬුරු වශයෙන් ඔප්පු කර පියතුමා ලවා දුගීන්ට බෙදා දීම.

2 පුණ්‍ය ආයතනයකට - අසල ඇති මහලු නිවසකට/අනාථ නිවසකට හෝ පුණ්‍ය ආයතනයකට හෝ බෙදා දීම.

3 පාසල - පන්ති භාර ගුරුවරයා, විදුහල්පතිතුමා හෝ පැවිදි සොහොයුරා/ කන්‍යා සොහොයුරිය මඟින් පාසලේම සිටින දුගියන් අතර බෙදා දීම.

**තක්සේරුව :**

- කුඩා සාන්තුවරයකු වීමට තමන්ට කළ හැකි දේ ලියා දක්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- රහසිගත ව අන් අයට උදවු කිරීමට යොමු වීම.

# කතෝලික ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ශිෂ්‍ය නාම<br>ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත. √<br>ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත. • |
| | | | | | | 1. මේ නව වසර සඳහා සිසුන් ලද සියලු ම දේ චිත්‍රයට නඟයි. |
| | | | | | | 2. දෙව්පියාණන් මැවූ දේ නිවැරදි ව යා කරයි. |
| | | | | | | 3. සතුන් ජලය පානය කරන චිත්‍ර ඇසුරින් සිසු අදහස් සරල වැකියකින් ලියා දක්වයි. |
| | | | | | | 4. හොඳ ළමයකුගේ ගුණාංග ප්‍රකාශ කරයි. |
| | | | | | | 5. දිනපතා ම අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු කිහිපයක් ඇඳ නම් කරයි. |
| | | | | | | 6. නිවසේ දී දෙමාපියන්ට කීකරු වූ අවස්ථාවක් චිත්‍රයට නඟයි. |
| | | | | | | 7. අසරණ අයට උදවු කළ හැකි අයුරු චිත්‍රයට නඟයි. |
| | | | | | | 8. යහපත් කිතුනු දරුවකු ලෙස කටයුතු කළ අවස්ථා ප්‍රකාශ කරයි. |
| | | | | | | 9. මහෝත්තම දෙවි පියාණන් වහන්සේ නමදින ආකාර චිත්‍රවලට ගැළපෙන ලෙස යා කරයි. |
| | | | | | | 10. දේව මෑණියන් තුළ තිබූ යහපත් ගුණාංග තමා තුළ ඇති කරගත හැකි අවස්ථා සරල ව ලියයි. |
| | | | | | | 11. නිර්මාණාත්මක යාච්ඤාව උච්චාරණය කර එය බලා ලියයි. |
| | | | | | | 12. සිසු කණ්ඩායම් අනුව අපට සහය වන අයගේ පින්තූර අලවා පෝස්ටරයක් නිර්මාණය කරයි. |
| | | | | | | 13. කුඩා ජේසුස් වහන්සේ තම මවුපියන්ට උදවු කළ ආකාරයට ඔබ නිවසේ දී ක්‍රියා කරන අයුරු ලියයි. |
| | | | | | | 14. මරණය ජය ගත් උත්තරීතර ජේසුස් වහන්සේව චිත්‍රයට නඟයි. |
| | | | | | | 15. ආදම් සහ ඒවගේ, කායින් සහ ආබෙල් කතාවලින් සිත් ගත් අවස්ථාවක් බැගින් චිත්‍රයට නඟයි. |
| | | | | | | 16. නෝවාගේ කතාවෙන් ගත හැකි ආදර්ශයක් ලියයි. |
| | | | | | | 17. සාන්ත දොමිනික් සාවියෝතුමා ගැන සරල වැකියක් ලියයි. |
| | | | | | | 18. කුඩා සාන්තුවරයකු වීමට තමන්ට කළ හැකි දේවල් ලියා දක්වයි. |
| | | | | | | 19. සාන්ත දොමිනික් සාවියෝතුමා ගැන සරල වැකියක් ලියයි. |
| | | | | | | 20. නෝවාගේ කතාවෙන් ගත හැකි ආදර්ශයක් ලියයි. |
| | | | | | | 21. ආදම් සහ ඒව, කායින් සහ ආබෙල් කතාවලින් සිත්ගත් අවස්ථාවක් බැගින් චිත්‍රයට නඟයි. |